අහෝසි කරන්න එකඟ වුණු හැම අවස්ථාව කදීම 13ත් තිබුණා. අද මරාගෙන මැරෙන්න හදන කවුරුවත් එදා විරුද්ධ වුණේ නැහැ. ඒ නිසා මේ කරන්නේ බොරුවක්. ඒ වගේම ඒ වෙලාවේ යුද්ධයක් තිබුණා. යුද්ධය අවසන් කරන්න ජනාධිපති ක්‍රමය වැදගත් වුණා කියලා සමහරු කියනවා. ඇත්ත ඒක නෙවෙයි.

ඇත්තටම සිදුවුණේ විධායක ජනාධිපති ක්‍රමය නිසා යුද්ධය ආරම්භ වීමත් තීව්‍ර වීමත් පමණයි. යාපනය පුස්තකාලය ගිනි තැබුවේ, 83 කළු ජූලිය නිර්මාණය කළේ විධායක ජනාධිපතිධුරයේ ආනුභාවයෙන්. යුද්ධය කළේ, ප්‍රභාකරන්ට මරාගෙන මැරෙන බෝම්බකරුවන් නිර්මාණය කරන්න අවස්ථාව හැදුවේ ජේ.ආර්. ජයවර්ධන විධායක බලයෙන් සිදුකළ ක්‍රියාමාර්ග නිසා. ප්‍රේමදාස ජනාධිපතිවරයා කොටි සංවිධානයට සල්ලි, අවි ආයුද දුන්නා. මහින්ද  රාජපක්ෂ කොටි සංවිධානයට සල්ලි දුන්නා. විධායක ජනාධිපති බලයෙන් යුද්ධය වර්ධනය කළා. යුද්ධය දිනුවේ විධායක ජනාධිපති කියලා කව්රු හරි කියනවා නම් ඒක බොරුවක්. මොකද, ජනපතිවරු 5 දෙනෙක් යටතේ මේ යුද්ධය ඉවර වුණේ නැහැ.

ඊට අමතරව ඇතැම් හාමුදුරුවන් වහන්සේලා කියනවා 20 ගේන්න කලින් අලුත් ජනවරමක් ගන්න ඕනෑ කියලා. නමුත් අපි උන් වහන්සේලාට ගෞරවයෙන් මතක් කරන්න කැමතියි විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න 1999, 2005, 2010, 2015 යන අවස්ථාවල ජනවරමක් ලැබී තිබෙනවා. එනිසා නැවත ජනවරමක් ඕන නැහැ.  තව සමහරු කියනවා, මේක යූ.ඇන්.පී. වුවමනාවක් කියලා. නමුත් ඒක අසත්‍යයක්. 20 සම්මත වීමෙන් පසුව ක්‍රියාත්මක වෙන්නේ 2020 ජනවාරි 08න් පසුවයි. අපි යෝජනා කරනවා ක්‍රියාත්මක වන දවසක පාර්ලිමේන්තුව විසුරුවන්න කියලා. එතකොට අලුත් පාර්ලිමේන්තුවක්, අලුත් ජනාධිපතිවරයෙක් රටට ලැබෙනවා, රනිල්ට අමතර බලයක් ලැබෙනවා කියන එක බොරුවක්.

තවත් සමහරු කියනවා, අපි මේක ගේන්නෙ ගෝඨාට භය නිසා කියලා. ජේ.වී.පී.එක බය වෙන්නේ ඇයි? ගෝඨා අපේ රටේ සමාජවාදය හදනවා නම් අපි බයයි. අලුත් මුහුණු ආවා කියලා අපේ රට හදන්න බැහැ. හැමදාම මේ පක්ෂ දෙකේ අලුත් මුහුණු ආවා. ජේ.ආර්, අවුරුදු 12ක් කරලා ගියා. ප්‍රේමදාස ඇවිත් රට විනාශ කරලා ගියා. චන්ද්‍රිකා ආවා, පරණ එන්ජිමම තමයි. මහින්ද ඇවිත් අවුරුදු 10ක් ඉඳලා රට විනාශ කරලා ගියා. යහ පාලනය කියලා රනිල් ආවා. දැන් මොකද වෙලා තිබෙන්නේ? ඊළඟට ගෝඨා මොකක් හරි කියාගෙන එයි. මේ රටට මොකුත් වෙනසක් වෙන්නේ නැහැ. එනිසා අපි පුද්ගල චරිතවලට රට හදන්න පුළුවන් කියලා විශ්වාස කරන්නේ නැහැ. විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම සඳහා හොඳම අවස්ථාව පාර්ලිමේන්තුවේ ඇතිවී තිබෙන මේ සංයුතිය කියලා අපි කල්පනා කරනවා. ඒ නිසා අපි හැමෝටම මේ ඒකාධිපති බලයට විරුද්ධව ශිෂ්ටත්වය පිළිබඳ අරගලයක් තිබෙනවා. ඒ අරගලය ජයග්‍රහණය කිරීම වෙනුවෙන් අපි හැමදෙනාම අපේ කාර්යභාරය ඉටු කරමු කියලා ආරාධනා කරනවා. ප්‍රජාතන්ත්‍රවාදය ගැන අලුත් සාකච්ඡාවක් ඕනෑ. අපේ ජීවිත, අපේ රට, අපේ පරිසරය, මේ සියල්ල තනි පුද්ගලයෙකු යටතට පත් කරන්න ඕනෑද? එනිසා අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ශිෂ්ට සම්පන්න පාලනයක් තහවුරු කරන්න ඕනෑ. අද අශිෂ්ටත්වය වෙනුවෙන් පෙනී ඉන්න පිරිසක් ජනමතය වෙනස් කරන්න හදනවා. 20ට එරෙහි සටන් පාඨය නියෝජනය කරන්නේ ජාතිවාදීන්. ජාතිවාදය කියන්නේ ගෝත්‍රවාදයක්. එනිසා අපිට ශිෂ්ටත්වය පිළිබඳව, මනුෂ්‍යත්වය පිළිබඳව අරගලයක් තිබෙනවා. ඒ වෙනුවෙන් සියලු දෙනාට එකතු වෙන්න කියලා අපි ආරාධනා කරනවා.



## ශ්‍රීලාල් සෙනෙවිරත්න



**සන්නස ගැන ඔබේ අදහස් අපට ලියන්න.**

Sannasa, Suite 504, 530 Little Collins Street, Melbourne 3000

Via Sannasa Website:
Visit www.sannasa.com.au

## නොලියූ ආදර හසුන

මිහිදන් කර තිබුන, ඒ මතකය පාදූ
යලි මතු උනා, පෙරදින ලක් බිම ආදූ
වලලා සියලු දේ, නව යුගයක් සාදූ
ජීවත් වෙන්න, ඇයි මට මෙතරම් බාදූ

පව්ලේ අය බලන්නට, හැම වස රේම
ඉඩ ලද පරිදි මම එමි, නොවරද වාම
මා ඔබ දුටු නමුදු, ඔබ මා නොදැ කීම
එය විය එදූ, මා ලද ලොකු සැන සීම

පොඩි පුතු අතින් අල්ලා කහ ඉර මැද් දෙන්
මහ මග මාරුවන්නට ඔබ කල යුද් දෙන්
වැලලූ අතීතය මතු උනි සහසුද් දෙන්
දෙවියනි එපා  එය සදහට වැලලෙද් දෙන්

කුල මල බේද තව දේවල් උඩට කරන්
කේන්ද්‍රරයෙ ඇති වගතුග හිතට අරන්
අවුරුදු දෙකක්, බැදි පෙම්දම බිඳල දමන්

ඔබ හැර ගියෙ මමයි, මව් පියො වදන අහන්
ගැලපෙන ලෙස සොයා දුන් ළඳ හැඩ කාර
ඔබ මෙන් නොවේ ඈ, උඩඟුයි කට කාර
ඇය නැහැ කැමති සාමය පිරි හරි පාර

මම පසුතැවෙමි ගෙට ගොඩවෙන හැම වාර
අද අපි පව්ල් කමු රටවල් දෙකක ඉඳ
මම දැන් පියෙකි ඔබ අම්මා කෙණෙකි සොඳ
විසුවත් ඇය සමග සිරිතට අනුව බැඳ

ඇත්තම කියමි, සතුටක් නම් නොමැත විඳ
මගෙ පුතු සරසවිය වෙත යන්නට සැර සේ
දියණිට දහ තුනයි, පාසැල් යන වය සේ
හිටියත් දැන් කලක්, මෙහි ඇවිදින් සතො සේ
හොල්මන් කරයි පාපය, මා කළ රහ සේ

ආදරයෙන් ඔබට ඔහු සලකන වාද
සැමියා දෙවියාය. නොකරනු මැන වාද
සිරිකත වඩියි නිවසට, නැති තැන බේද
මගෙ මිතුරියේ, ඔබ හොඳ සතුටින් නේද

## ආනන්ද ගුණතිලක

හොපර්ස් ක්‍රොසිං

